# 25. කිතුනු පාස්කුව

දේවාසිරි !

හිතවත් එලියේසර්,

ජුදෙව් ජාතිකයෙක් ලෙස ඔබ පාස්කු උත්සවය පැවැත් වූ අන්දම දැන ගැනීමට ඉතා සතුටුයි. අපේ ජේසුස් වහන්සේත් කුඩා කාලයේ සිට පාස්කුව පැවැත්වීමට සහභාගි වුණා. උන්වහන්සේගේ මරණය සිදු වූයේත් ජුදෙව් පාස්කු මංගල්‍ය කාලයේ දී එහෙත් ජේසුස් වහන්සේ තුන් දවසකින් මළ වුන්ගෙන් නැගිටීමෙන් මරණයෙන් ජය ගත්තා. එය සිදු වූයේ සතියේ පළමුවෙනි දා එනම් ඉරිදා උදෙන්ම ය.

ඒ නිසා දෙව් මැදුරේ සීනුව උදෙන් ම නාද කරනවා. අපේ පළාතේ නම් පාන්දරම අපි පන්දම් අරගෙන ගම වටේ පෙරහැරක් යනවා. එයට ''හලෙලූයා පෙරහැර'' කියනවා. ඊට පසු අපි දේව මෙහෙයට දෙව්මැදුරට යනවා.

සෑම පල්ලියකම උදේ ම දේව මෙහෙයක් ඉතා උත්සවාකාරයෙන් පවත්වනවා. කුඩා ළමයි බිත්තර ගෙනවිත් පූජා කරනවා. එසේ කරන්නේ ජේසුස් වහන්සේ මරණය පරාජය කර අපට අලුත් ජීවිතයක් දුන් බව සිහිපත් කරන්නයි. පසුව එම බිත්තර ළමා නිවසකට හෝ වැඩිහිටි නිවසකට බාර දෙනවා.

පාස්කු ඉරිදා දවල් ආහාරයට විශේෂ කෑම වේලක් අපේ නිවෙස්වල සූදානම් කරනවා. අපි එදින ප්‍රීතියෙන් ගත කරනවා. සමහර පළාත්වල සවස් වරුවේ ගීත මෙහෙයක් පවත්වනවා. ඒ ගීත හරි ම ලස්සනයි.

මරුවා පරදා ජයගත් සමිඳුට මුළු දවස ම තුති ගී ගායනා කරනවා.

ඔබට සහ ඔබගේ නිවසේ සැමට දේව පිහිටයි.

මෙයට
හිතවත්
ලක්ෂ්මී

## පැවරුම්

පහත සඳහන් කෙටි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේ කුඩා කාලයේ සිට සහභාගි වූයේ කුමන මංගල්‍යයට ද?
2. කිතුනුවන් පාස්කුව ඉරු දිනයක පවත් වන්නේ ඇයි?
3. ජේසුස් වහන්සේ මළවුන්ගෙන් නැගිට්ටේ කෙදිනකට පසුව ද?
4. කිතුනුවන් පාස්කුව පවත්වන්නේ උදේ කාලයේ ද? රාත්‍රී කාලයේ ද?
5. පාස්කු දේව මෙහෙය පවත්වන වේලාවේ කුඩා ළමුන් ගෙනැවිත් පූජා කරන්නේ කුමක් ද?